# කාර් එකේ මීයෙක්!



මෙතුලි පමුදිතා රණවීරගේ

කෘතියේ නම: කාරෙකේ මීයෙක්

කතෘගේ නම: මෙතුලි පමුදිතා රණවීරගේ

කතෘගේ වෙනත් කෘති:

- පමුදි මායා පාසලට යයි
- දඟ මෙතුලි

කෘතිය පළ කරන දිනය: 08.02.2025

ISBN: 978-624-208-376-6

# පිදුම

මාගේ දයාබර අම්මාටද ,

අප්පච්චීටද ,

මට මේ කතාව ලිවීමට උදව් කළ

මාගේ අත්තම්මලා දෙන්නාට

සහ අත්තා වෙතටයි…

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන හෙරණගත්කරණී ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදූහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදූහල්පතිනිය

ශශිකලා සේනාධීර

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

එක ගමක තිබුණා ලොකු ගෙදරක්. ඒ ගෙදර වාසය කළේ අම්මා කෙනෙකුයි තාත්තා කෙනෙකුයි පුතෙකුයි විතරයි.

ඔවුන් බොහොම පොහොසත්.



ඒ ගොල්ලන්ට ලස්සන කාර් එකකුත් තිබුණා. ඒ කාරෙක ඉතාමත් වටිනා කාර් එකක්.

ඒ තාත්තා ඒ කාරෙකට හරිම කැමතියි.



ඒත් තියෙන එකම ප්‍රශ්නය තමයි ඒ ගොල්ලෝ හැම වෙලේම කනවා, කනවා, කනවා. ඉවරයක් නැහැ!

කොච්චර නවත්වන්න හැදුවත් ඒ ගොල්ලන්ට හැම වෙලේම කන එක නවත්වන්න බැහැ!

ඒ හින්දා ඒ ගමේ අය ඔවුන්ට බඩජාරියෝ කියලා නමක් පටබැන්දා.

සමහර අය එයාලාට කන එක ගැන කවි හැදුවා.

මෙන්න ඒ කවිවලින් එකක්.

බීඩජාරියෝ කනජාරියෝ

හැම වෙලේම කන ජාරියෝ

කාලා කාලා බඩ පුරවලා

තවත් කන්න හොයනවා....!



මම කලින් කීවා නේද මෙයාලා හැම වෙලේම කනවා කියලා. එතකොට එයාලගේ ගෙදර හොඳටම අපිරිසිදු වෙනවා.

හැම තැනම ඉතුරුවෙච්ච කෑම!
අස්කරන්න කෙනෙකුත් නැහැ!!
කන අය අස්කරන්නෙත් නැහැ!!!

හොඳටම අපිරිසිදු නිසා මීයෝ ඇවිත් පදිංචි වුනා.
ටික ටික මීයන්ගේ රාජධානියක් වුනා.

හිතා ගන්නම බැරි දේ තමයි, ඒ ගොල්ලන් ඒ ගැන පොඩ්ඩක්වත් වද වුනේ නැහැ.

ඊට පස්සේ ඒ ගොල්ලන්ගේ වටිනා කාර් එකටත් මීයෙක් රිංගුවා.

හැබැයි ඒ ගොල්ලෝ දන්නේවත් නැහැ!



දවසක් ඒ ගොල්ලන්ට එයාලාගේ නෑදෑයෙකුගේ මඟුල් ගෙදරකට යන්න ආරාධනයක් ලැබුණා.

මඟුල් ගෙදර තිබුණේ ගොඩාක් ඈත.

ඒ ගොල්ලෝ තීරණය කළා කලින් දවසේ කොළඹ ලොකු හෝටලයක නැවතිලා දෙවන දවසේ මඟුල් ගෙදර යන්න.

මඟුල් ගෙදර යන දවස උදාවුනා.

හැම දෙයක්ම සූදානම්!

අම්මා කාර් එකේ දොර ඇරලා බෑග් එක දැම්මා!

එතකොටම තඩි මීයෙක් කාර් එකේ ඉඳලා එළියට පැන්නා!

අම්මා හොඳටම බියවී කෑගැසුවා!

තාත්තා කාර් එක පරික්ෂා කර බැලුවා.



මීයා කාර් එකේ ආසන හපලා දමලා. ඒකේ තිබුණ වයරුත් හපලා!

අන්තිමේදී ඒ ගොල්ලන්ට ගමන යන්නත් බැරිවුණා.

ඒ වෙලාවෙම තාත්තා නගරයට ගිහින් මී උගුලක් අරන් ඇවිත් ඒකට පාන් කෑල්ලක් දමා කාර් එක ඇතුළේ උගුල ඇටෙව්වා.



අනෙක් දවසේ බලන කොට මීයත් නැහැ! පාන් කැල්ලත් නැහැ!

එදා හවසත් මීඋගුල ඇටෙව්වා.

අනෙක් දවසේ බලද්දී මීයා කොටුවෙලා!

තාත්තා මීයාව වත්ත පහළ වෙළට ගිහින් දැම්මා.

ඒ වෙළ තිබුණේ පොඩි ඇළකිනුත් එහා.

හැබැයි අනෙක් දවසේ බලන කොට මීයා අම්මාගේ කණ්ණාඩි මේසයේ ලාච්චුවක් ඇතුළේ!



ඊට පස්සේ තාත්තා තව පාරක් මී උගුල ඇටෙව්වා.

ඊළඟ දවසේ බලද්දී මීයා ආයෙත් කොටුවෙලා.

තාත්තා මීයාට ආයේ එන්න බැරිවෙන්න ඈත කැලේකට ගිහින් දැම්මා.

ඊට පස්සේ ගෙදරත් කාරෙකත් පිරිසිදුව තියා ගත්තා.

ඒක නිසා ආයේ කවදාවත් මීයෝ ආවේ නැහැ!



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.
මෙවර ඒ සදහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.
මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

**ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,**
**සෙනෙවිරත්න මහලේකම්**

ISBN: 978-624-208-376-6